(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 74.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 පෙබරවාරි මස 23 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0324/’10

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සිගරට් පරිභෝජනය තුරන් කර දැමීම ‘මතට තිත’ වැඩ සටහනට ඇතුළත් කර තිබේද;

(ii) පසුගිය වර්ෂ පහ තුළ ශ්‍රී ලංකාවේ සිගරට් සහ බීඩි පරිභෝජනය වාර්ෂික පදනමින් කොපමණද;

(iii) පසුගිය වර්ෂ හය තුළ දේශීය වශයෙන් නිපදවන ලද සිගරට් සහ බීඩි ප්‍රමාණය වාර්ෂික පදනමින් කොපමණද;

(iv) පසුගිය වර්ෂ හය තුළ රටට ආනයනය කරන ලද සිගරට් ප්‍රමාණය කොපමණද;

(v) දේශීය වශයෙන් නිෂ්පාදිත හා ආනයනික සිගරට් මත බදු පැනවීමෙන් පසුගිය වර්ෂ හය තුළ උපයා ගන්නා ලද ආදායම වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0549/’10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ රලිතුලායි පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන් ද?

0559/'10

3.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) පසුගිය ජනාධිපතිවරණයේදී ඉදිරිපත් කළ මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ "විශ්‍රාමික දිවියට අත්වැලක්" යටතේ විශ්‍රාමිකයන්ට සහනයක් වශයෙන් 2006 ට පෙර විශ්‍රාම ලැබූ අයට 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන අයුරින් විශ්‍රාම වැටුප සකස් කොට ඊළඟ අයවැයේ සිට (2010) ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව 2010 අයවැයේදී 2006 ට පෙර විශ්‍රාම ගිය අයට, 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන ලෙස විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කර තිබේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල කොපමණද;

(iii) එම සහනය 2010 අය වැයෙන් ලබා දී නැත්නම්, ඊට හේතු කවරේද;

(iv) එම විශ්‍රාම වැටුප් වැඩිවීම ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0570/'10

4.

ගරු කරු ජයසූරිය මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රද්දොළුගම නිවාස සංකීර්ණයේ ඉතිරිව ඇති බිම් කැබලි විකිණීමට නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ සැළසුමක් එහි නිවාසලාභීන් අතිගරු ජනාධිපතිතුමා වෙත කළ පැමිණිල්ලක් අනුව අත්හිටවූ බවත්;

(ii) ඒ සම්බන්ධව ජනාධිපති විමර්ශණ අංශය කළ පරීක්ෂණයේ නිර්දේශය ජනාධිපති ලේකම් විසින් එවකට නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති වෙතද, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු අංක SP/4/2/4/2/1 හා 2006/02/28 දිනැති ලිපියෙන් දන්වා ඇති බවත්;

(iii) එම ලිපියේ (කෙටියෙන්) "ඉතිරිව ඇති කුඩා බිම් කැබලි වසර 23 ක පමණ කාලයක් එහි නිවැසියන් භුක්ති විඳ ඇති හෙයින් ඔවුනට විකිණීමෙන් පවරාදීමට අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කර තිබිණ. ජනාධිපති විමර්ශන අංශයේ නිර්දේශය අනුව රද්දොළුගම නිවාස සංකීර්ණය වටා යාමට ඇති මාර්ගය 1820 බිම් කොටසෙන් වෙන් කිරීම සහ 1819 බිම් කැබැල්ල යාබද නිවැසියන් වෙත විකිණීමෙන් පවරාදීම සුදුසු බවත් දන්වමි" යන්න සඳහන්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අතිගරු ජනාධිපතිතුමාගේ ඉහත නියෝගය නොපමාව ඉටුකර දීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0682/'10

5\.

ගරු ඒ. විනායගමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කිලිනොච්චියද ඇතුළු උතුරු පළාත තුළ, ආරක්ෂක හමුදා විසින් දැනට ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කරන පෞද්ගලික නිවාස හා ආයතන සංඛ්‍යාව කොපමණදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ස්ථානයන් ඒවායේ මුල් අයිතිකරුවන්හට ආපසු භාර දෙන්නේ කවදාදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0706/'10

6\.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වර්ෂ 2005 සිට 2009 දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 වැනි දිනට හිමිකම් ලබමින් සිටින සමෘද්ධිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ හිමිකම් ලද අයට ගෙවන ලද මුදල් ප්‍රමාණයන්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) 2005, 2006, 2007, 2008 සහ 2009 වර්ෂවල සමෘද්ධිලාභීන්ට වාර්ෂිකව ගෙවන ලද මුළු මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් වර්ෂය තුළ සමෘද්ධිලාභීන් වශයෙන් සිට එහෙත්, පසුව ඉවත් කරන ලද සංඛ්‍යාව, එම අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එසේ ඉවත් කරන ලද පදනම කවරේද;

(iii) එම කාල සීමාවේදී අලුතින් එක් වූ සමෘද්ධිලාභීන් සිටී නම්, ඔවුන්ට ගෙවූ මුදල් ප්‍රමාණය සහ ඔවුන්ගේ ලිපිනයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0707/'10

7\.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු නැගෙනහිර පුනරුත්ථාපන සංවිධානය (NERDO—North East Rehabilitation and Development Organisation) නම් සංවිධානයක් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර තිබේද;

(ii) එසේ නම්, එය ලියාපදිංචි කරන ලද දිනය කවරේද;

(iii) එම සංවිධානය පිහිටුවීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සංවිධානයේ කාර්යාලය පිහිටා ඇති ස්ථානය, එහි ප්‍රධානීන්ගේ නම්, කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0848/'10

8.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම් දිස්ත්‍රික්කයේ ඇති එකම කෘෂි ආර්ථික මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නොරොච්චෝල ප්‍රදේශයේ බවත්;

(ii) කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සාරවත් බවක් නොමැති, දීර්ඝ වැලිබිම් තීරුවකින් වැසී ඇති බවත්;

(iii) එම ප්‍රදේශයේ ගොවීන් විසින් යූරියා ඇතුළු රසායනික පොහොර යොදා සාරවත්කර ගනු ලබන එම අසාරවත් වැලිබිම් තීරුව තුළ ලංකාවට අවශ්‍ය රතුළූණු, එළවළු, පළතුරු අවශ්‍යතාවයෙන් 1/3ක් පමණ අතිසාර්ථකව නිෂ්පාදනය කරන බවත්;

(iv) එසේ වුවද වී වගාවේදී රජය මඟින් යූරියා ඇතුළු අනෙකුත් පොහොර සඳහා ලබා දෙන සහනාධාරය කල්පිටිය ගොඩ ගොවිතැන් කරන ගොවීන්ට නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වී වගාව සඳහා ලබාදෙන පොහොර සහනාධාරය අසාරවත් පොළව සමඟ ගැටෙන්නාවූ අති දුෂ්කර කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොඩ ගොවිතැන් කරන ගොවියන්ටත් ලබාදීම සුදුසු බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම පොහොර සහනාධාරය කල්පිටියේ ගොවීන්ටත් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0877/'10

9.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වීරවිල ජාත්‍යන්තර ගුවන් තොටුපල ඉදිකිරීම සඳහා 2007, 2008, 2009 සහ 2010 වර්ෂවල වැයකරන ලද මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට ගෙනයන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම ව්‍යාපෘතිය අතහැර දැමීම නිසා ශ්‍රී ලංකා රජයට සිදුව ඇති අලාභය කොපමණද;

(v) එම අලාභය සිදුවීමට වගකිව යුතු තැනැත්තා හෝ තැනැත්තන් කවුරුන්ද;

(vi) ඔවුන්ට එරෙහිව ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0886'/10

10.

ගරු විජිත හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, පැපිලියවල, පල්ලේගම පිහිටි බප/ගම්/ආනන්ද විද්‍යාලයේ වර්ෂ 2011 සඳහා පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත්කර ගැනීම පිණිස සම්මුඛ පරීක්ෂණ පැවැත් වූ දිනයන් කවරේද;

(ii) සුදුසුකම් ලද හා නොලද අයදුම්කරුවන්ගේ නම්, ලිපිනයන්, අදාළ ගනය හා ලකුණු වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ අදාළ චක්‍රලේඛයට අනුව අයදුම්පත්‍රයේ සඳහන් ලියාපදිංචි ඡන්ද හිමි නාම ලේඛනවල තොරතුරු සනාථ කර ගැනීම පිණිස ග්‍රාම නිලධාරී ලිපියක් අවශ්‍ය වන්නේද යන්නත්;

(ii) ග්‍රාම නිලධාරී ලිපියක් නොතිබූ පමණින් චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් සනාථ කිරීමේ ලිපි ලේඛන පරීක්ෂා කිරීම ප්‍රතික්ෂේප කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හැකියාව තිබේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ග්‍රාම නිලධාරී ලිපියක් නොතිබූ ඇතැම් අයදුම්කරුවන් නැවත සම්මුඛ පරීක්ෂණයට වෙනත් දිනයක කැඳවා තිබූ බවත්;

(ii) ඒ සඳහා විධිමත් දැනුම් දීමක් කර නොතිබූ බැවින් එක් අයදුම්කරුවෙකු අසාධාරණයට ලක්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) මේ අනුව අසාධාරණයට ලක් වූ එම අයදුම්කරුට සාධාරණය ඉටුකර දීමටත්;

(ii) මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්;

එතුමා පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0888/’10

11.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව, පේරකනත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගහේයාය ඉඩමේ බිම් කැබලි 42 ක් 2002 වර්ෂයේ දී ඉඩම් කච්චේරියක් පවත්වා ඉඩම් නොමැති ගොවීන් අතර බෙදා දී ඇති බවත්;

(ii) පසු කාලයකදී එම ඉඩම්ලාභීන් පලවා හැර වෙනත් පුද්ගලයින් විසින් එම ඉඩම් කොටස් බලහත්කාරයෙන් අල්ලාගෙන ඇති බවත්;

(iii) එසේ පලවා හරින ලද ඉඩම්ලාභීන් විසින් ඒ පිළිබඳව පැමිණිලි කළද මේ දක්වා ඒ පිළිබඳ කිසිදු විභාගයක් පවත්වා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වර්ෂ 2002 දී ඉඩම් බෙදාදීමට අනුව එම ඉඩම්ලාභීන්ගේ නාම ලේඛනය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) තම ඉඩම්වලින් පලවා හරින ලද එම ඉඩම්ලාභීන් විසින් ඉදිරිපත් කළ පැමිණිලි විභාග කර ඔවුන්ගේ ඉඩම් අයිතිය තහවුරු කර නැවත පදිංචි කරවීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0584/'10

12.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ හතරක කාලය තුළ ද්විපාර්ශ්වික පදනම මත මිත්‍ර රටවලින් සහ බහුපාර්ශ්වික ආයතනවලින් ලබා ගන්නා ලද ණය මුදල් ආපසු ගෙවීමට ලබාදෙන කාලය සහ ණය ආපසු ගෙවීම සඳහා ලබා දෙන ලද සහන කාල සීමාව සම්බන්ධයෙන් කරන ලද අලුත්කිරීම් කවරේද;

(ii) එවැනි පහසුකම් ලබාදෙන ලද දිනය කවරේද;

(iii) එවැනි පහසුකම් ලබා දීමේ අරමුණ කවරේද;

(iv) ඉහත කී ණය මුදල් සම්බන්ධයෙන් කිසියම් ආරම්භක ගාස්තුවක්, පොරොන්දු ගාස්තුවක්, කළමනාකරන හෝ පරිපාලන ගාස්තුවක්, රක්ෂණ වාරිකයක්, සහ හෝ වෙනත් කිසියම් නමවලින් හැඳින්වෙන පිරිවැයක් දැරීමට සිදුවී තිබේද;

(v) එක්වර ගෙවිය යුතු ගෙවීම් හෝ වාර්ෂිකව ගෙවිය යුතු ගෙවීම් තිබේද;

(vi) පිරිවැය සාධකයක් ලෙස රට කෙරෙහි බලපෑමක් ඇති කරන ඉහත කී ගෙවීම් සඳහා වර්ෂයකට ගෙවීමට තිබෙන මුදල් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0732/'10

13.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2006 සිට මේ දක්වා විදේශයන්හිදී මිය ගිය විදේශගත ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් මාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මරණවලට හේතු කවරේද;

(iii) එසේ මිය ගිය අයගෙන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගත් මෘත දේහ සංඛ්‍යාව කොපමණද;

(iv) මෘත දේහ ගෙන්වා ගැනීමට නොහැකි වූයේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මිය ගිය අය වෙනුවෙන් මෙතෙක් වන්දි ලබා දී ඇති අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) මිය ගිය අය වෙනුවෙන් වන්දි ලබා නොදුන් අවස්ථා වේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0585/'10

14\.
ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය, 1970 - 1980, 1980 - 1990, 1990 - 2000 යන කාලසීමාවන්හිදී සම්පූර්ණයෙන් ලබා ගත් ණය මුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ණය මුදල් බහු පාර්ශ්වීය ණය මුදල්ද; නොඑසේ නම් ද්විපාර්ශ්වීය ණය මුදල්ද;

(iii) ඉහත කී ණය මුදල් සඳහා අදාළවන පොලී අනුපාතිකයන් සහ වාර්ෂිකව ගෙවන ලද පොලී මුදල කොපමණද;

(iv) එකී ණය මුදල් සම්පූර්ණයෙන් ගෙවා නිමකර තිබේද;

(v) ඉහත කී ණය මුදල් සඳහා ගෙවන ලද සම්පූර්ණ පොලිය සහ ප්‍රාග්ධන ක්‍රමක්ෂය වාර්ෂික පදනමින් කොපමණද;

(vi) දැනට ලබා ගෙන ඇති ණය සඳහා 2015 සිට 2020 දක්වා (වසර පහක) කාලසීමාව සඳහා ගෙවිය යුතු සමස්ත පොලිය සහ ප්‍රාග්ධන ක්‍රමක්ෂය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0833/'10

15\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කටුනායක ගුවන් තොටුපලේ රාජකාරි කටයුතු සඳහා යොදවා ඇති ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ගුවන් තොටුපලේ රාජකාරියේ යෙදී සිටින එම සේවකයින් සපුරාලිය යුතු සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කටුනායක ගුවන් තොටුපලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සඳහා එම දෙපාර්තමේන්තුවට අයත් නොවන බාහිර පුද්ගලයින් යොදවා තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම පුද්ගලයන්ගේ සුදුසුකම් කවරේද;

(iv) එවැනි පිරිසක් සේවයේ යෙදවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී පියරතන ප්‍රජා සංවර්ධන සහ සමාජීය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

2.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"යූ. එල්. එම්. ෆාරුක් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

3.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සුසන්ත පුංචිනිලමෙ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

4.

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 4),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"හෙළ උදාව ජාතික ව්‍යාපාරය සංස්ථාගත කිරීම සඳ හා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2010 නොවැම්බර් 22 දිනැති අංක 1681/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 2009 අංක 14 දරන පනතින් සංශෝධිත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3ඇ වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2010 නොවැම්බර් 19 දිනැති අංක 1680/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2010 දෙසැම්බර් 15 දිනැති අංක 1684/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 4),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2010 දෙසැම්බර් 31 දිනැති අංක 1686/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 26 වැනි වගන්තිය යටතේ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2010 නොවැම්බර් 19 දිනැති අංක 1680/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියමය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමඟ කියවිය යුතු 2006 අංක 11 මුදල් පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ආ) ඡේදයේ (i) සහ (ii) වැනි උපඡේද යටතේ මෝටර් වාහන අනුග්‍රාහක බද්ද සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2010 නොවැම්බර් 19 දිනැති අංක 1680/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2009 අංක 13 දරන මුදල් (සංශෝධන) පනතින් සංශෝධිත 2002 අංක 11 දරන මුදල් පනතේ 2 වැනි වගන්තිය යටතේ, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2010 නොවැම්බර් 24 දිනැති අංක 1681/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 55 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 52 වැනි වගන්තිය යටතේ වූ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 නොවැම්බර් 19 දිනැති අංක 1680/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ නියමය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමඟ කියවිය යුතු එකී පනතේ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14අ වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2010 නොවැම්බර් 19 දිනැති අංක 1680/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 1),— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින්, මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් පනවන ලදුව, 2010 නොවැම්බර් 19 දිනැති අංක 1680/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 926 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 2),— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, මධ්‍යසාර සඳහා වූ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2010 නොවැම්බර් 19 දිනැති අංක 1680/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 927, 928, 929 සහ 930 දරන සුරාබදු නිවේදන)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*12.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමඟ කියවිය යුතු (52 වැනි අධිකාරිය වූ), සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, දේශීය ඖෂධ නිෂ්පාදනය හා වෙනත් අනුමත කර්මාන්ත හා කාර්යයන් සඳහා යොදා ගනු ලබන ඊතයිල් මධ්‍යසාර මත බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2010 ඔක්තෝබර් 28 දිනැති අංක 1677/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 925 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— පරිසර සංරක්ෂණ බදු පනත යටතේ නියමය,— 2008 අංක 26 දරන පරිසර සංරක්ෂණ බදු පනත යටතේ පරිසර සංරක්ෂණ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2010 නොවැම්බර් 19 දිනැති අංක 1680/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*14.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2010 නොවැම්බර් 19 දිනැති අංක 1680/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*15.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2010 නොවැම්බර් 22 දිනැති අංක 1681/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*16.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 3),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2010 දෙසැම්බර් 23 දිනැති අංක 1685/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*18.

ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— පොහොර විධිමත් කිරීමේ පනත යටතේ නියෝග,— 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතේ 28 වැනි වගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2010 දෙසැම්බර් 06 දිනැති අංක 1683/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලැබ, 2011.02.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*22.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*23.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2011 ජනවාරි මස 04) [1]

*25.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2011 ජනවාරි මස 04) [1]

26.

මහේෂ්වරි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

27.

ශ්‍රී ලංකාවේ සැමට සෙත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

28.

පින සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.